DOI : 10.31357/fhssmst.2009.00667

# මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
26 APR 2011
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

පියුමා එදිරිසිංහ

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා

සමාජ විද්‍යා විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි

අපේක්ෂකයාගේ ප්‍රකාශය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා කථිකාචාර්ය චානක උදයකුමාර උපදේශකවරයාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරනු ලද බවත්, මෙම පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බව සහතික කරමි.

2009

පියුමා එදිරිසිංහ

# <u>උපදේශකවරයාගේ ප්‍රකාශය</u>

පහත අත්සන් කරන ලද මාගේ සුපරීක්ෂාව යටතේ පියුමා එදිරිසිංහ මිය විසින් සකස් කරන ලද මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක් යන මාතෘකාව යටතේ මෙම නිබන්ධනය 2011.01.26 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේදී පැවති වාචික පරීක්ෂණයේදී නිබන්ධන පරීක්ෂකවරුන් විසින් පෙන්වා දෙන ලද සංශෝධන සියල්ල නිසි පරිදි සම්පූර්ණ කිරීමෙන් සංස්කරණය කර ඇති බවත් මෙම සංශෝධිත නිබන්ධන පිටපත් පශ්චාද් අධ්‍යයන පීඨයට භාරදීමට සුදුසු තත්ත්වයක පවතින බවත් සහතික කරමි.

දිනය 2011.04.26

උදය කුමාර අමරසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

පටුන


| | |
|---|---|
| | පිටු අංකය |
| පටුන | **I-III** |
| සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර සටහන් | **IV-V** |
| ස්තුතිය | **VI** |
| සාරාංශය | **VI** |
| **පලමු පරිච්ඡේදය** | **1-8** |
| **හැඳින්වීම සහ ක්‍රමවේදය** | |
| 1.1 මාතෘකාව | |
| 1.2 හැඳින්වීම | |
| 1.3 අධ්‍යයනයේ අරමුණු | |
| 1.4 උපන්‍යාසය | |
| 1.5 මූලාශ්‍ර හා ක්‍රමවේදය | |
| 1.6 නියැදිකරණය හා දත්ත රැස්කිරීම | |
| 1.7 පරිච්ඡේදකරණය | |
| **දෙවන පරිච්ඡේදය** | |
| සංකල්ප හා න්‍යායාත්මක විග්‍රහය | **8-33** |
| 2.1 හැඳින්වීම | |
| 2.2 වරද හා අපරාධ සංකල්ප | |
| 2.3 කාන්තාව හා පවුල | |
| 2.4 සිරගත කිරීම සහ එහි අරමුණු | |
| 2.5 මත්ද්‍රව්‍ය වැරදි | |
| 2.6 සට්ටනවාදී න්‍යාය සහ කාන්තා අපරාධ | |
| 2.7 අවස්ථාමය න්‍යාය කාන්තා අපරාධ | |
| 2.8 උපසංස්කෘතික න්‍යාය කාන්තා අපරාධ | |

**තුන්වන පරිච්ඡේදය**

**මත්ද්‍රව්‍ය භාවිතයේ ගෝලීය තත්ත්වය හා ශ්‍රී ලංකාව** 34-52

3.1 ගෝලීය තත්ත්වය

3.2 ශ්‍රී ලංකාවේ තත්ත්වය

3.3 කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා එහි බලපෑම

3.4 කාන්තාවන් සිරගත වීම හා ඒ ආශ්‍රිත ගැටළු

**හතරවන පරිච්ඡේදය**

**මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් කාන්තාවන් සිරගත වීම හා** 53-90

**ඒ ආශ්‍රිත තත්ත්වයන් හඳුනා ගැනීම**

පෞද්ගලික තොරතුරු

4.1. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගතවූ කාන්තාවන්ගේ වයස් සංයුතිය

4.2 මත්ද්‍රව්‍ය වැරදි වල යෙදෙන කාන්තාවන්ගේ ආගම

4.3 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගතවූ කාන්තාවන්ගේ අධ්‍යාපන පසුබිම

4.4 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගතවූ කාන්තාවන්ගේ විවාහක තත්ත්වය

4.5 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගතවූ කාන්තාවන්ගේ පදිංචිය හා වාසස්ථාන

4.6 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ සේවා නියුක්තිය

4.7 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ කාන්තාවන්ගේ දෛනික ආදායම් තත්ත්වය

4.8 මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි වල ස්වභාවය

4.9 මත්ද්‍රව්‍ය වැරදි වල ස්වභාවය අනුව දුර්භාවිතයේ යෙදෙන සංඛ්‍යාව

4.10 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයින්ගේ තත්ත්වය

4.11 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ දරුවන්ගේ තත්ත්වය

4.12 මත්ද්‍රව්‍ය දුර්භාවිත කාන්තාවන්ගේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම

4.13 මත්ද්‍රව්‍ය දුර්භාවිත කාන්තාවන්ගේ දරුවන්ගේ රැකියාවල තත්ත්වය

4.14 මත්ද්‍රව්‍ය දුර්භාවිත කාන්තාවන්ගේ දරුවන්ගේ විවාහක තත්ත්වය

4.15 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ දෙමාපියන්ගේ තත්ත්වය

4.16 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ සහෝදර සහෝදරියන්ගේ තත්ත්වය

4.17 කාන්තාවන් මත්ද්‍රව්‍යවලට යොමු වූ ආකාරය

4.18 කාන්තාවන් නැවත නැවතත් සිරගත වීමේ ස්වභාවය

4.19 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ නියැදිය තුළින් ලබා ගත් දත්ත

4.20 සිද්ධි අධ්‍යයනය

**පස්වන පරිච්ඡේදය**

නිගමන හා යෝජනා 91-101

ආශ්‍රිත ග්‍රන්ථ 102-109

උපග්‍රන්ථය

## සංඛ්‍යා වගු සහ ප්‍රස්තාර සටහන්

සංඛ්‍යා වගු පිටු

අංකය


වගු අංක- 1.1 මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා සම්බන්ධ ගෝලීය හා ආසියානු තත්ත්වය 02

වගු අංක- 1.2 මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම් 03

වගු අංක- 3.1 එංගලන්තයේ හා වේල්ස්යේ අධිකරණ මගින් වරදකරුවන් වූවන් 39

අපරාධය අනුව වර්ගීකරණය කිරීම

වගු අංක- 3.2 මත්ද්‍රව්‍ය අනුව අත්අඩංගුවට ගැනීම් 41

වගු අංක- 3.3 මත්ද්‍රව්‍ය වැරදි හේතුවෙන් අත්අඩංගුවට පත් අයගේ ස්ත්‍රී පුරුෂ අනුපාතය 43

වගු අංක- 3.4 වැරදිවල ස්වභාවය අනුව බන්ධනාගාර ගත වීම් 50

වගු අංක- 3.5 මත්ද්‍රව්‍ය හා සුරා බදු වැරදි සඳහා බන්ධනාගාර ගත වූ කාන්තාවන් සංඛ්‍යාව 51

වගු අංක- 4.1 මත්ද්‍රව්‍ය වැරදි සඳහා යොමු වූ කාන්තාවන්ගේ වයස් සංයුතිය 54

වගු අංක- 4.2 මත්ද්‍රව්‍ය වැරදිවලට යොමු වූ වයස 55

වගු අංක- 4.3 මත්ද්‍රව්‍ය වැරදිවල නිරත කාන්තාවන්ගේ ආගමික තත්ත්වය 56

වගු අංක- 4.4 මත්ද්‍රව්‍ය වැරදිවල නියුතු කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම 57

වගු අංක- 4.5 මත්ද්‍රව්‍ය දුර්භාවිත ආශ්‍රිත වැරදිවල නිරත කාන්තාවන්ගේ විවාහක තත්ත්වය 58

වගු අංක- 4.6 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ

විවාහක වයස් මට්ටම 59

වගු අංක- 4.7මත්ද්‍රව්‍ය වැරදි ආශ්‍රිත කාන්තාවන්ගේ පදිංචිය හා වාසස්ථාන වල ස්වභාවය 60

වගු අංක- 4.8 මත්ද්‍රව්‍ය වැරදිවල නිරත කාන්තාවන්ගේ සේවා වියුක්තිය 61

වගු අංක- 4.9 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූ

කාන්තාවන්ගේ දෛනික 62

ආදායම් තත්ත්වය

වගු අංක- 4.10 මත්ද්‍රව්‍ය වැරදිවල නිරත කාන්තාවන්ගේ ජනවර්ගය 64

වගු අංක- 4.11 මත්ද්‍රව්‍ය වැරදිවල ස්වභාවය අනුව දුර්භාවිතයේ යෙදෙන සංඛ්‍යාව 65

වගු අංක- 4.12 මත්ද්‍රව්‍ය වර්ගය අනුව දුර්භාවිතයේ යෙදෙන සංඛ්‍යාව 65

වගු අංක- 4.13 පවුල් ජීවිත ගත කරන ලද කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයින්ගේ තත්ත්වය 69

වගු අංක- 4.14 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ දරුවන්ගේ වයස 70

වගු අංක- 4.15 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූදුර්භාවිත කාන්තාවන්ගේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම 71

වගු අංක- 4.16 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ දුර්භාවිත කාන්තාවන්ගේ දරුවන්ගේරැකියාවල තත්ත්වය 73

වගු අංක- 4.17 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ දුර්භාවිත කාන්තාවන්ගේ දරුවන්ගේ විවාහක තත්ත්වය 74

වගු අංක- 4.18 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ දුර්භාවිත කාන්තාවන්ගේ දෙමාපියන්ගේ තත්ත්වය 75

වගු අංක- 4.19 මත්ද්‍රව්‍යවැරදි සම්බන්ධයෙන් සිරගත වූ දුර්භාවිත කාන්තාවන්ගේ සහෝදර සහෝදරියන්ගේ තත්ත්වය 76

වගු අංක- 4.20 කාන්තාවන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිවලට යොමු වූ ආකාරය 77

වගු අංක- 4.21 සිරගත වූ කාන්තාවන්ගේ පවුල් වල නියැදියට ඇතුලත් වූ ඥාතීන් 79

වගු අංක- 4.22 මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන් නැවත නැවතත් 82
බන්ධනාගාර ගත වීමේ ස්වභාවය

<u>ප්‍රස්තාර සටහන්</u>

ප්‍රස්තාර අංක 3.1- පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල මත්ද්‍රව්‍ය ආශ්‍රිත 38
අපරාධ සඳහා වරදකරුවන්ගේ සංඛ්‍යා දත්ත

ප්‍රස්තාර අංක 3.2 – මත්ද්‍රව්‍ය වැරදි හේතුවෙන් අත්අඩංගුවට පත් 41
ස්ත්‍රී පුරුෂ අනුපාතය 1991-2006

ප්‍රස්තාර අංක 5.1- අධ්‍යයනයට පත් කාන්තාවන්ගේ හෙරොයින් භාවිතයේ ස්වභාවය 68

<u>සිතියම</u>

සිතියම් අංක 01- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව අත්අඩංගුවට පත්වීම්

## ස්තුතිය

"මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වන කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්" මැයෙන් සිදු කරන ලද මෙම පර්යේෂණ කාර්යයක පවත්නා කාලීන වැදගත්කම පිළිබඳව මා දැනුවත් කොට, ආරම්භයේ සිට ඊට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙමින්, මෙම පර්යේෂණ නිබන්ධනයේ උපදේශකවරයා වශයෙන් ක්‍රියා කරමින් මාර්ගෝපදේශකත්වය සැපයූ කථිකාචාර්ය උදය කුමාර අමරසිංහ මහතා මෙහිලා දැක්වූ සහයෝගය බෙහෙවින් අගය කොට සලකමි

02. මෙම පර්යේෂණ කාර්යය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මූලාශ්‍ර සපයා දෙමින් නිතර මා උනන්දු කළ කථිකාචාරිනී අනූෂා ඒදිරිසිංහ මහත්මිය ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි

03. වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයේ ප්‍රධාන ජේලර් කුමාරි රත්නවීර මිය ඇතුළු නිලධාරී මණ්ඩලය විසින් මෙම පර්යේෂණ කටයුතු වෙනුවෙන් ආරම්භයේ සිට මා වෙත දැක්වූ සුහදශීලි සහයෝගය පිළිබඳවද සිහිපත් කරමි. පර්යේෂණ කටයුතු සඳහා ආරම්භයේ සිට අවසානය දක්වා ඉතා උනන්දුවෙන් සහයෝගය ලබාදුන් ප්‍රසාදි සචින්තනී මෙනවිය, ජයමාලි මහකුමාරගේ මහත්මිය සහ පී.ඩබ්,ඒ කපිලවංශ මහතාටද මාගේ කෘතඥතාව පලකරනු කැමැත්තෙමි

**මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වන කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්**

**පියුමා එදිරිසිංහ**

**නිබන්ධන සාරාංශය**

මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් කාන්තාවන් වරදකරුවන් බවට පත්ව බන්ධනාගාර ගත වීම මෙරට ගැටළුවක් ලෙස වර්ධනය වී ඇත. එලෙස කාන්තාවන් බන්ධනාගාර ගත වීම නිසා ඔවුන් විවිධ ගැටළු වලට මුහුණ දෙන අතර පවුල් පරිසරය තුළ විසංවිධානකාරී බවක් ඇතිවේ.

වැලිකඩ බන්ධනාගාරයට ඇතුල් වූ මත්ද්‍රව්‍ය වැරදි සඳහා වන කාන්තාවන් මුහුණ පාන ගැටළු ගණනාවකි. එසේම ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින්ද මොවුන් බන්ධනාගාර ගත වීම තුළින් විවිධ ගැටළු වලට මුහුණ දෙනු ලැබේ. මෙම අධ්‍යයනය තුළින් අදාල කාන්තාවන්ගේ පවුල් හා සමාජ පසුබිම කෙරෙහි හා ගැටළු පිළිබඳ අවධානය යොමු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වූ කාන්තාවන් හැත්තෑපස් (75)දෙනෙක්ගෙන් සහ එම කාන්තාවන්ගේ පවුල්වල සාමාජිකයින්ගෙන් තොරතුරු රැස් කරන ලදී. මත්ද්‍රව්‍ය භාවිතා කරන වැඩි දෙනෙකු මැදිවියේ පසුවන්නන් වූ අතර මත්ද්‍රව්‍ය භාවිතා කරන කාන්තාවන් හා ගණිකා වෘත්තිය අතර සම්බන්ධතාවයක් පවතින බව මෙම අධ්‍යයනයේදී අනාවරණය විය. මෙම කාන්තාවන්ගෙන් වැඩි දෙනෙක් අඩු අධ්‍යාපනයක් ලබා ඇති අතර අඩු වයසින් විවාහ වී, විවාහ ජීවිතද අසාර්ථක වූවෝ වෙති. එසේම මෙම කාන්තාවන්ගේ සේවා නියුක්ති තත්ත්වය පිළිබඳ සලකා බැලීමේදී මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපගාමී චර්යාවන් වෙත යොමුවීමට එයද ඉවහල් වී ඇත. බිඳුණු පවුල් පරිසරය, මව හා පියාගේ මත්ලෝලීත්වය සහ පවුල් පරිසරය තුළ කාන්තාවගේ පරාධීනත්වය යන සාධක නිසා කාන්තාව මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹී ඇති බව ආවරණය විය.

# පළමු පරිච්ඡේදය

## හැඳින්වීම සහ ක්‍රමවේදය

1.1 මාතෘකාව

1.2 හැඳින්වීම

1.3 අධ්‍යයනයේ අරමුණු

1.4 උපන්‍යාසය

1.5 මූලාශ්‍ර හා ක්‍රමවේදය

1.6 අධ්‍යයන ක්ෂේත්‍රය

1.7 නියැදිකරණය හා දත්ත රැස්කිරීම

1.8 පරිච්ඡේදකරණය

1.1 මාතෘකාව.

මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් සිරගත වන කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්.

1.2 හැඳින්වීම

වර්තමානයේ සෑම රටක්ම මුහුණ දෙන්නාවූ සමාජගත ගැටළුකාරී තත්ත්වයන් අතර ප්‍රධාන තැනක් මත්ද්‍රව්‍ය දූර්භාවිතයට හිමිවේ. මත්ද්‍රව්‍ය භාවිතය පුද්ගලයාට ශාරීරික හා මානසික වශයෙන් පීඩාවට පත්කෙරෙන සාමාජයට හානිකර වූ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ව්‍යාප්ත වී ඇති මෑතකාලීනව අවසන් විසඳුමක් කරා පැමිණිය නොහැකි ගැටළුවක් බවට පත්ව ඇත. එක්සත් රාජධානිය, යුරෝපය ඇතුළු බටහිර රටවල් වල ස්ත්‍රීන් හා පුරුෂයින් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි සැලකිය යුතු වෙනස්කම් දක්නට නොලැබෙතත් පෙරදිග රටවල කාන්තාවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පුරුෂ පක්ෂයට සාපේක්ෂව අඩු මට්ටමක පවතී. පෙරදිග රටවල ඓතිහාසිකව ගොඩනැගුණු සමාජ සාරධර්ම හා සමාජ සම්මතයන් නිසා ස්ත්‍රී වර්ගයා තුල මත්ද්‍රව්‍ය අඩු මට්ටමකින් පැවතීමට හේතු වී ඇතැයි සිතිය හැකි වුවද විසිවන සියවසේ අගභාගයේ සිට මේ දක්වා කාලය තුළ මත්ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ සංඛ්‍යා ලේඛන පිරික්සීමේදී ස්ත්‍රීන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ වර්ධනයක් පෙන්නුම් කෙරේ. මෙම වර්ධන රටාව දිගටම පැවතුනහොත් ඉදිරි දශක තුනක කාලය අවසානයේ පෙරදිග රටවලද ස්ත්‍රී පුරුෂ මත්ද්‍රව්‍ය භාවිත තත්ත්වයන්හි වෙනස අවම විය හැක. ස්ත්‍රීන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය වඩාත් හානිකර වන්නේ පිරිමින්ගේ මත්ද්‍රව්‍ය භාවිතයට වඩා පෙරදිග පවුල් සංස්ථාවේ බිඳවැටීමට වඩාත් සංවේදී වන බැවිනි (Recearch Monograph,2006:3).

පහත සඳහන් සංඛ්‍යා ලේඛණ අනුව බිලියන 50කට ආසන්න වූ ලෝක ජනගහණයෙන් අවුරුදු 15-64ත් අතර වූ 5% පමණ ප්‍රමාණය එනම් මිලියන 2000 පමණ වූ ජනතාව පසුගිය මාස 12 ඇතුලත අඩුම වශයෙන් එක් වරක් හෝ නීති විරෝධි මත්ද්‍රව්‍ය භාවිතා කොට තිබෙන අතර ඇස්තමේන්තු ගත ආකාරයට වාර්ෂිකව ලෝක ජනගහනයෙන් මිලියන 180ක් පමණ නීති විරෝධී මත්ද්‍රව්‍ය භාවිතා කරනු ලැබේ

(http://www.unodc.ory/pdf/wdr-2006-volum2.PDF). ලෝකය පුරා වැඩි වශයෙන් භාවිතා වූ මත්ද්‍රව්‍ය කැනබීස් වන අතර කැනබීස් භාවිතා කරන මිනිසුන් මිලියන 144ක ප්‍රමාණයකින් මිලියන 53.5ක ප්‍රමාණයක් ආසියානුවන් වේ.

<u>වගු අංක 1.1. මත්ද්‍රව්‍ය දුර්භාවිය හා සම්බන්ධ ගෝලීය සහ ආසියානු තත්ත්වය.</u>

| | නීති විරෝධි මත්ද්‍රව්‍ය | කැනබීස් | | ATS | | අබිං | | හෙරොයින් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ලෝකය | ආසියාව | ලෝකය | ආසියාව | ලෝකය | ආසියාව | ලෝකය | ආසියාව |
| ලෝක ජනගහනය (මිලියන) | 180 | 144.1 | 53.5 | 24.2 | 2.1 | 13.5 | 8.62 | 9.18 | 5.74 |
| වසය අවු.15ට වැඩි ජනගහනය % | 3.6% | 3.4% | 2.1% | 0.6% | 0.7% | 0.3% | 0.35% | 0.22% | 0.24% |

(Source: Colombo Plane Drug Advisory Programme 2001:17 )

ශ්‍රී ලංකාවේ පසුගිය වසර කීපය තුළ මත්ද්‍රව්‍ය වැරදි ආශ්‍රිතව අත්අඩංගුවට ගන්නා ලද ප්‍රමාණය නොනවත්වා වර්ධනය වී තිබෙන අතර මෙම අනතුරුදායක තත්ත්වය ප්‍රධාන ලෙස තරුණ පරම්පරාව තුළ හඳුනා ගත හැකි වේ. එසේම මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වන කාන්තාවන්ගේ වර්ධනයක් පෙන්නුම් කරන බව පහත සඳහන් සංඛ්‍යා ලේඛන ආශ්‍රයෙන් පැහැදිළි වේ.

වගු අංක 1:2 මත්ද්‍රව්‍ය සම්බන්ධ අත්අඩංගුවට ගැනීම්

| වර්ෂය | පිරිමි | ගැහැණු |
|---|---|---|
| 2002 | 9740 | 77 |
| 2003 | 10291 | 197 |
| 2004 | 10279 | 140 |
| 2005 | 13291 | 144 |
| 2006 | 10214 | 170 |

(Source: Prison statistic of Sri Lanka, Vol.28-2009:74 )

ඉහත සියළු තත්ත්වයන් යටතේ වාර්ෂිකව මත්ද්‍රව්‍ය ගැටළුව සම්බන්ධයෙන් කාන්තා සිරකරු ජනගහනය ඉහළ යාමට ඔවුන්ගේ පවුල් පසුබිම ඇතුළු අනෙකුත් සාධක කොතෙකුත් දුරට බලපෑම් ඇති කිරීමට සමත්ව ඇත්ද යන්න පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරවමින් අධ්‍යයනය කරන ලදී. එහිදී විශේෂයෙන් කාන්තාවන්ගේ අනාගතය සුභදායී හෝ දුක්ඛදායී එකක් බවට පත්කිරීමේ මූලික වගකීම පවුල් හා සමාජ පරිසරයෙන් ඉටුවේ ද, ඇය පවුල හා සමාජය තුළින් ලබා ගන්නා වූ අත්දැකීම් යම් යම් අවස්ථාවලදී බලපෑම් ඇති කරයිද, ඒ ආශ්‍රිතව අත්විඳිනු ලැබූ ඇතැම් මනෝකාරක තත්ත්වයන් ඇයගේ අනාගත චර්යාවන් කෙරෙහි බලපෑම් ඇති කරයිද යනාදී තත්ත්වයන් පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන ලදී. සැබැවින්ම කාන්තාවන් මත්ද්‍රව්‍ය ආශ්‍රිත අපරාධකරුවකු වන්නේ කුමන තත්ත්වයක් යටතේද? යන්න ගැටළු සහගත වන අතර එකී ගැටළු වලට නිශ්චිත පිළිතුරක් සොයා ගැනීම අපරාධ පාලන හා නිවාරණ ක්‍රියාවලියට අතිශය වැදගත් වනු ඇත. තවද මත්ද්‍රව්‍ය දුර්භාවිතය ආශ්‍රිතව පැන නගිනු ලබන අර්බුදකාරී තත්ත්වයන් අවම කිරීම තුළින් පවුල් හා සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම කඩිනම් අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා කාන්තාවගේ දායකත්වය මෙහිදී අවධාරණය කරන ලදී. විෂය ක්ෂේත්‍රයට අදාළව පවත්නා ගැටළුවක් පිළිබඳව අධ්‍යයනය කර තොරතුරු හෙළිදරව් කිරීම තුළින් ඒ හා සමගාමීව ගොඩ නැගී ඇති ගැටළු කිහිපයකට විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමටද හැකිව ඇත. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් බිහිවීමට බලපාන හේතු සාධක අධ්‍යයනය කිරීම තුළින් එම වරදකරුවන්

යහපත් පුද්ගලයෙකු ලෙස සමාජගත කිරීම සඳහා බන්ධනාගාර සංකල්පය තුළ ගැබ්ව ඇති අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමේදී බන්ධනාගාර පද්ධතිය ප්‍රතිව්‍යුහ ගත විය යුතු ආකාරය පිළිබඳව නව යෝජනා අදහස් ඉදිරිපත් කර ඇති අතර ඒ සියළු තත්ත්වයන් යටතේ මෙම පර්යේෂණය කාලීන වැදගත්කමකින් යුක්ත වූවක් යයි සිතමි.

**1:3 අධ්‍යයනයේ අරමුණු**

I. මත් ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන්ගේ පවුල් හා සමාජ පසුබිම හඳුනා ගැනීම.

II. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් සිරගත වූ කාන්තාවන් හා ඔවුන්ගේ පවුල් වල සමාජිකයින් මුහුණ දෙන ගැටළු පිළිබඳ අධ්‍යයනය කිරීම.

III. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් කාන්තාවන් බන්ධනාගාර ගතවීමට බලපාන ලද හේතු අධ්‍යයනය කිරීම.

**1:4 උපන්‍යාසය**

"මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා කාන්තාවන් බන්ධනාගාර ගත වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ අඩු අධ්‍යාපනය හා පහත් ආර්ථික තත්ත්වයයි.

**1:5 මූලාශ්‍ර හා ක්‍රමවේදය.**

*<u>මූලාශ්‍ර</u>*

"මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාර ගත වන කාන්තාවන්ගේ පවුල් පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනයක්" යන අධ්‍යනයට අදාලව තොරතුරු ලබා ගැනීමේදී ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර 02ක් උපයෝගී කර ගෙන අදාල තොරතුරු ලබා ගන්නා ලදී. එනම් ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතීක මූලාශ්‍රයි.